කම්කරු දෙපාර්තමේන්තුව
தொழில் திணைக்களம்
DEPARTMENT OF LABOUR

කම්කරු මහ ලේකම් කාර්යාලය අංක 41, කිරුල පාර, කොළඹ - 05, ශ්‍රී ලංකාව.
தொழிற் செயலகம், இல.41,கிருள வீதி, கொழும்பு 05, இலங்கை.
Labour Secretariat, No. 41, Kirula Road, Colombo - 05, Sri Lanka.


මගේ අංකය :
எனது இலக்கம் : WCA/05/2022/09/C/NCPA/111
My No :

ඔබේ අංකය :
உமது இலக்கம் :
Your No :

දිනය / திகதி / Date:2022/11/07

## මාධ්‍ය නිවේදනයයි.
## සංගීත කණ්ඩායමක් තහනම් කිරීම පිළිබඳවයි.

කම්කරු දෙපාර්තමේන්තුව විසින් පරිවාස දෙපාර්තමේන්තුව සහ පොලිස් දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කරමින් පොළොන්නරුව මැදිරිගිරියේ "ආශාවරී" නම් වූ සංගීත කණ්ඩායමක් ද්වේශ සහගත ආකාරයට තහනම් කිරීමට කටයුතු කල බවට මේ දිනවල සමාජ මාධ්‍ය ඔස්සේ සාවද්‍ය ප්‍රචාරයන් පලවන බවට වාර්තා වී ඇත. ඒ පිළිබඳ මෙම දෙපාර්තමේන්තුවේ ස්ථාවරය මෙමගින් දන්වා සිටිමි.

ළමා ශ්‍රමය මෙරටින් තුරන් කිරීමේ කාර්යභාරය පැවරී ඇති රාජ්‍ය දෙපාර්තමේන්තුව වශයෙන් කම්කරු දෙපාර්තමේන්තුව 1956 අංක 47 දරණ ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන ළමා ශ්‍රමය යෙදවුම් සම්බන්ධ පැමිණිලි විමර්ශන කිරීම මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධාන කාර්යභාරයක් වේ. එකී පැමිණිලි විමර්ශනය කර ළමා ශ්‍රමයක් හෝ අනතුරුදායක ළමා ශ්‍රමයක් පවතිද යන්න පිළිබඳව සාක්ෂි රැස්කිරීමෙන් අනතුරුව ඉදිරි පියවර තීරණය කරනු ලබයි. ඒ හැර, සංගීත කණ්ඩායම් තහනම් කිරීම මෙන්ම දරුවන්ගේ කලා හා ප්‍රාසාංගික දක්ෂතා යටපත් කිරීම සම්බන්ධ කිසිදු කටයුත්තක් මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු නොකරන බව අවධාරණය කරමි.

එසේම, ළමයින්ගේ කලා හැකියාවන් ප්‍රගුණ කිරීමට අනතුරුදායක නොවන පුහුණුවීම් කටයුතු සිදුකිරීමටත් පාසැල් සංදර්ශන වලදී රඟදැක්වීම් කිරීමටත් ඉහත සඳහන් කල ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත මගින් බාධා ඇති නොකරයි.

2022.09.23 දින වැලිවේරිය ප්‍රදේශයේ රාත්‍රි කාලයේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබූ ඉහත නම් සඳහන් සංගීත කණ්ඩායමේ ඉල්ලීම පිළිබඳ මෙම දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී තිබූ අතර, එම විමර්ශන කටයුතු සිදු කරන අවස්ථාවේදී නිලධාරීන්ගේ රාජකාරියට බාධා කරමින් සමාජ මාධ්‍ය හරහා සාවද්‍ය ප්‍රචාරයක් ජනගත කර ඇති බව මා වෙත වාර්තා වී ඇත.

ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුව විසින් සංගීත කණ්ඩායමක් තහනම් කිරීමට කටයුතු කර ඇති බවට පළවන සියළු ප්‍රචාරයන් සාවද්‍ය ප්‍රචාරයන් බව දන්වා සිටිමි.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව

එක්ව කැපවෙමු ළමා ශ්‍රමය පිටු දකිමු
ஒன்றிணைவோம்.சிறுவர் தொழிலை இல்லாதொழிப்போம்


Telephone Nos - 011 2581142-3-6 011 2369373
Fax - 011 2581145
P.O. Box - 575
E-Mail : cgldol@sltnet.lk
Web : www.labourdept.gov.lk